# ජගත් මිහිතල දිනය සැමරීම - 2022 අප්‍රේල් 22




එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2009 වසරේදී සම්මත කරන ලද යෝජනාවක් අනුව නම් කරන ලද මෙම දිනය "පොළව මත ඇති සියළුම ජීවීන්ගේ පැවැත්ම තහවුරු කරන පද්ධතියක් ලෙස මිහිතලය සැලකීම" යන්න අරමුණු කර ගෙන ඇත. ජගත් මිහිතල දිනය ප්‍රථම වරට 1970 අප්‍රේල් 22 දින එක්සත් ජනපදයේදී සමරන ලදී. ඒ සඳහා, හේතු පාදක වූයේ යුරෝපීය ජාතීන් විසින් සිදු කරණ ලද අධික සම්පත් පරිභෝජනය හේතුවෙන් සිදුවූ වායු දූෂණය සහ ජල දූෂණය හේතුවෙන් මානව සෞඛ්‍ය සඳහා එල්ලවූ තර්ජන මඟහරවා ගැනීම සඳහා ජනතාව පෙළගැසීමයි. අද වන විට රටවල් 193ක බිලියන 1 ක පමණ ජනතාව මිහිකත දිනයට සහභාගී වී පරිසරය සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට අධිෂ්ඨාන කරගෙන පෙළ ගැසෙති.

## ජගත් මිහිතල දිනයේ ආරම්භය හා විකාශනය




ජගත් මිහිකත දින සංවිධානය විසින් මෙවර ජගත් මිහිතල දිනය තේමාව ලෙස ප්‍රකාශ කර ඇත්තේ "අපගේ මිහිතලය වෙනුවෙන් ආයෝජනය කරමු" (Invest In Our Planet ) යන්නයි.ඒ අනුව දේශගුණ විපර්යාස හමුවේ සිදු කළ යුතු හරිත ආයෝජන, පරිසර දූෂණය වළක්වාගැනීම වෙනුවෙන් ප්ලාස්ටික් සහ පොලිතීන් නිසි පරිදි බැහැර කිරීම සහ ජෛව විවිධත්ව සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ලොව පළමුවරට මිහිතල දිනය සැමරුනේ 1970 වර්ෂයේදීය. මේ සඳහා පුරෝගාමී වී කටයුතු කරන ලද්දේ ඇමරිකානු සෙනෙට් සභිකයෙකු හා පරිසරවේදියකු වූ ගේලෝඩ් නෙල්සන් නැමැත්තෙකි. ඔහු හා හාවඩ් විශ්වවිද්‍යාලයේ දේශපාලනිකව ක්‍රියාකාරී සරසවි සිසුවෙකු වූ ඩෙනිස් හේස් විසින් මිහිතල දිනය වශයෙන් අප්‍රේල් 22 යොදාගන්නා ලදි. ඔවුන් විසින් 1970 **අප්‍රේල්** මස 22 දින දහස් ගනන් ජනතාව විදීවලට ගෙන්වා ඇමරිකාවේ පැවති පරිසර විනාශය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා වගකිවයුත්තන්ගේ අවධානය යොමු කරවීමේ අරමුණින් මිහිතලය සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රමදාන හා පෝස්ටර් ව්‍යාපාර ඇතුළුව සංවිධානය කරන ලද සාමකාමී පරිසර අරගලයක් ලෙස මිහිතල දිනය ආරම්භ කර ඇත. මෙහිදී එකල පැවති වියට්නාම් යුද්ධයෙන් සිදු වන පරිසර විනාශය පිළිබඳ ජනතාවගේ අවධානය යොමු නොවන බව දුටු ඔහු, දුමාරය,තෙල් වැගිරීම් හා කෘමිනාශක ආදීයෙන් පෘථිවියට සිදු වන හානිය සම්බන්ධයෙන් අවධානය යොමු කරවන ලදී. මේ සඳහා ඇමරිකානුවන් මිලියන විස්සක් පමණ සහභාගි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස වසර කිහිපයක් තුළ ඇමරිකාවේ පරිසර

සංරක්ෂණයට අදාළ අණ පනත් ගණනාවක් ඇති වූ අතර ඒ සඳහා වගකිව යුතු ආයතන කිහිපයක් ද ස්ථාපනය කිරීමට ද අවධානය යොමු කර තිබෙන බව පිළිගනී.

මෙම මිහිතල දිනය ඇමරිකාව තුළ ආරම්භ වුවද පසුව ලොව දසත ව්‍යාප්ත වූ සංකල්පයකි. 1980 දශකයේ සිට සෑම වසරකම අප්‍රේල් මස 22 වැනි දිනය මිහිතල දිනය ලෙස සැමරීමට ලොව පුරා රටවල් රැසක් අවධානය යොමු කර ඇත. 1990 වන විට ලොව පුරා රටවල් 141ක පුද්ගලයින් මිලියන 200ක පිරිසක් මෙම දිනය සැමරීමට එක්විය. 2000 වසර වන විට ලොව පුරා පරිසර සංවිධාන 5000ක දායකත්වයෙන් රටවල් 184ක ලෝක මිහිතල දිනය සමරන ලදී. එහෙත් මෙම දිනය එක්සත් ජාතීන් ගේ දිනයක් සේ නොසැලකේ. නමුත් 2009 වසරේ දී 'ජාත්‍යන්තර මිහිතල මාතා දිනය' යනුවෙන් හැඳින්වෙන්නේ ද අප්‍රේල් 22 වන දිනයයි. මෙය එක්සත් ජාතීන්ගේ සංවත්සර දිනයකි. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 2009 වර්ෂයේ දී සම්මත කරන ලද යෝජනාවක් අනුව මෙම දිනය නම් කරන ලදී. එහි අරමුණ "පොළව මත ඇති සියලුම ජීවීන්ගේ පැවැත්ම තහවුරු කරන පද්ධතියක් ලෙස මිහිතලය සැලකීම" යන්නයි.

සෑම වර්ෂයකම මිහිතල දිනය සැමරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර 2011 වසරේ දී මිහිතල දිනය සමරමින් ඇෆ්ගනිස්තානයේ පැල මිලියන 28ක් රෝපණය කිරීමේ වැඩසටහනක් ද, පැනමාවේ වඳ වී යෑමේ තර්ජනයට ලක් වූ ඕකිඩ් වර්ග 100ක් අලුතින් රෝපණය කර නඩත්තු කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලදී. 2012 වසරේ දී මිහිතල දිනය වෙනුවෙන් කාබන්ඩයොක්සයිඩ් වායු දූෂණය පිටුදැකීම සහ ඉන්ධන පිරිමැස්ම අරමුණු කරගනිමින්, චීනයේ පුද්ගලයන් ලක්ෂ ගණනක් වාහන භාවිතයෙන් තොරව බයිසිකල් පදිමින් ලොවට ම ආදර්ශයක් සැපයා ඇත.

එසේම 2016 වර්ෂයේ සිට තේමාවක් යටතේ ලෝක මිහිතල දිනය සමරන ලදී. 2016 වසරේ ‘මිහිතලය වෙනුවෙන් ශාක’ යනුවෙන් ද, 2017 වසරේ ‘පාරිසරික සහ කාලගුණික සාක්ෂරතාව’ යනුවෙන් ද, 2018 දී ‘ප්ලාස්ටික්වලින් සිදු වන දූෂණය නවතමු’ යනුවෙන් ද, 2019 වසරේ දී ‘අපගේ ජීවී විශේෂයන් සුරකිමු’ යනුවෙන් ද, 2020 දී ‘කාලගුණික විපර්යාස වෙනුවෙන් ගත යුතු පියවර’ යනුවෙන් ද 2021 වසරේ දී 'පෘථිවිය යථා තත්ත්වයට පත් කරමු' යන්න ද මේ වසරේ, එනම් 2022 දී ' පෘථිවිය වෙනුවෙන් අයෝජනය කරමු' යන්න තේමා කර ගෙන ලෝක මිහිතල දිනය සමරනු ලබයි. ඒ අනුව සමස්තයක් ලෙස සැලකීමේ දී නූතන පරිසර සංරක්ෂණ ව්‍යාපාරයේ වැදගත් ඓතිහාසික දිනයක් ලෙස ලෝක මිහිතල දිනය සැලකිය හැක.

**පරිසර අමාත්‍යාංශය විසින් 2022 වසරේ ජගත් මිහිතල දිනය සැමරීම සඳහා සිදුකරන ක්‍රියාකාරකම්**

- **මෙම වසරේ ජගත් මිහිතල දිනය සැමරීම සඳහා පරිසර අමාත්‍යාංශයේ භූමි සම්පත් අංශය විසින්** මෙම වසරේ ජගත් මිහිතල දිනය සැමරීම වෙනුවෙන් අමාත්‍යාංශයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් **2022.04.22 දින පෙ.ව 9. 15 සිට ප.ව 1.30 දක්වා අමාත්‍යාංශයේ 8 වන මහලේ පිහිටි ශ්‍රවණාගාරයේදී** පැවැත්වීමට භූමි සම්පත් අංශය කටයුතු සංවිධානය කර ඇත.

- මෙම වැඩසටහනේ දේශන වෙනුවෙන් සහභාගීවන දේශකයන් සහ දැනුවත් කිරීම සඳහා තෝරාගත් දේශන පහත පරිදි වේ.

1. සුදේශ් නන්දසිරි මහතා, සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ, ලංකා අපද්‍රව්‍ය කළමනාකරණ පුද්ගලික සමාගම/ ලංකා අපද්‍රව්‍ය කළමනාකරණ පිරිපහදු පුද්ගලික සමාගම - **මිහිතලය ආරක්ෂා කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිවැරදිව කළමනාකරණය සඳහා ආයෝජනය කිරීම.**
2. මහාචාර්ය ටර්නි ප්‍රදීප් කුමාර, සාගර විද්‍යා හා සමුද්‍ර භූ විද්‍යා දෙපාර්තමේන්තුව, ධීවර, සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය - **ජෛව විවිධත්ව හායනය හා සංරක්ෂණය සාගර සම්පත් කෙරෙහි බලපාන අයුරු**
3. රංග පල්ලාවල මහතා, පොදු රාජ්‍ය මණ්ඩල දේශගුණික අරමුදල මූල්‍ය උපදේශක **- හරිත ආර්ථිකයක් කරා පියමැනීමේදී දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා වූ මූල්‍යමය අවස්ථාවන්**

- මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා අමාත්‍යාංශයේ නවක නිලධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන් 100 ක් පමණ සම්බන්ධ කරගෙන ඇත.